# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,491 - 2026 මැයි මස 29 සිකුරාදා - 2026.05.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | 804 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූනි මස 19 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජූනි මස 05 වැනි දින දහවල් 12. 00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

803 - B 082797 — - (2026/05)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## දකුණු පළාත් සමාජ සුබසාධන,පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

### ස්ථානභාර නිලධාරි (ආශ්‍රිත නිලධාරි සේවා ගණයට අයත් III ශ්‍රේණිය) තනතුර සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම

දකුණු පළාත් සමාජ සුබසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කංචදේව ළමා නිවාසයේ ස්ථාන භාර නිලධාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත දකුණු පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු සංඛ්‍යාව : 01

01. **බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්, දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර එම යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල අනුව පුරප්පාඩුව සම්පූර්ණ කරනු ලැබේ. එම එක් එක් පරීක්ෂණයේ දී ලකුණු ලබාගත යුතු ආකාරය මෙම නිවේදනයේ අංක 08 යටතේ දක්වා ඇත.

02. **අවශ්‍ය සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් :**

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම;

*සහ*

II. ඉංග්‍රීසි භාෂා දැනුම

*අ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක්;

*හෝ*

*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

03. **පළපුරුද්ද :**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව MN1-2025 හෝ ඊට ඉහළ වැටුප් කේතයක් හිමි පළාත් රාජ්‍ය සේවයේ තනතුරක වසර 05 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

04. **කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකු ම දකුණු පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් සහ ළමයින් වැඩිහිටියන් හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සමඟ කටයුතු කිරීමටත් ප්‍රමාණවත් මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

05. **වෙනත් සුදුසුකම් :**

I. අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක (03) කාලයක් අඛණ්ඩව දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය. (පදිංචි ඡන්ද හිමි නාමලේඛනයේ සහතික කල උද්ධෘතයන් මඟින් සනාථ කල හැකි විය යුතුය.)

II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

III. දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2020 හි විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුය.)

V. නීතිය ඉදිරියේ වරදකරුවෙකු නොවූ නීති ගරුක පුද්ගලයකු බවට පදිංචි ප්‍රදේශයට අයත් පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් නිකුත් කරන ලද මාස 03ක් ඇතුළත ලබාගත් පොලිස් සහතිකයක් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

VI. පූර්ව අපරාධමය හෝ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ චෝදනාවකට ලක් නොවූවෙකු හා යහපත් චරිතයකින් හා මනා සමාජ හැසිරීමකින් හෙබි අයෙකු බවට ග්‍රාම නිලධාරී වාර්තාවක් හා තමන් පදිංචි ප්‍රදේශයේ සාමදාන විනිශ්චකාරවරයකුගෙන් හා පූජ්‍ය පක්ෂයේ අයෙකුගෙන් ලබා ගන්නා චරිත සහතික 02ක් අයදුම්කරු විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.(නිවාස ගත දරුවන්ගේ වැඩිහිටියන්ගේ හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතභාවය මෙම චරිත සහතික වලින් අපේක්ෂා කෙරේ. )

VII. බඳවා ගන්නා අවස්ථාවේ දී ළමුන්, වැඩිහිටියන් හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්, සමඟ කටයුතු කිරීමට සුදුසු යහපත් කායික හා මානසික සෞඛ්‍ය තත්ත්වයක් ඇති බවට රජයේ වෛද්‍ය නිලධාරියෙකුගෙන් ලබා ගන්නා ලද සහතිකයක් අයදුම්කරු විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය.

06. **වයස් සීමාව ;**

අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

උපරිම සීමාව : අදාළ නොවේ.

07. **වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු.53,060 –10 x 800 - 11 x 1,190 – 10 x 1,320– 5 x 1,350 – රු.94,100/- (MN 04 -2025) වේ.

ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

08. **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.**

I. *යෝග්‍යතාවය ඇගයීමේ පරීක්ෂණය* :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| *උපාධියට අමතරව ලබා ඇති අතිරේක අධ්‍යාපන සුදුසුකම් :*<br><br>පශ්චාත් උපාධිය සඳහා ලකුණු 15<br>ඩිප්ලෝමාවක් සඳහා ලකුණු 2 ½ බැගින් උපරිම ඩිප්ලෝමා 2 | ලකුණු 20 | 40% |
| අදාළ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම, ආකල්ප හා පෞරුෂත්වය, විෂයට අදාළ දැනුම පරීක්ෂා කිරීමට සකසන ලද ව්‍යුහගත ප්‍රශ්න (වාචික පරීක්ෂණයකි)<br><br>• දරුවන් සමඟ කටයුතු කිරීම සම්බන්ධයෙන් හා ආයතනයේ මානව හා භෞතික සම්පත් පාලනය කිරීමට අදාළ කළමනාකරණ හා පරිපාලන හැකියාව<br><br>• නීතිමය කටයුතු අණපනත් සම්බන්ධයෙන් ඇති අවබෝධය | ලකුණු 25 | |

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| රාජ්‍ය සේවයේ යෙදී සිටිය දී ලැබූ ප්‍රශංසා සහතික (පොදු 230 බී ආකෘතිය අනුව විය යුතුය)<br>එක් සහතිකයකට ලකුණු 05 බැගින් උපරිම සහතික 04 | ලකුණු 20 | 40% |
| ඵලදායීතාවය හා නායකත්ව කුසලතා සම්බන්ධයෙන් ලබා ඇති පුහුණුවලට අදාළ සහතික<br>එක් සහිතකයකට ලකුණු 05 බැගින් උපරිම සහතික 06 | ලකුණු 30 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | ලකුණු 05 | |

- සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් අතරින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතා අනුපිළිවෙළ අනුව තනතුරට බඳවා ගනු ලැබේ.
- බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේ දී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුමත කිරීම පත්කිරීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.
- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන්නේ විෂය භාර පළාත් අමාත්‍යාංශ ලේකම්වරයා විසිනි.

09. **අපේක්ෂකයාගේ අනන්‍යතාවය :**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ වූ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද ඡායා පිටපත් කට්ටලයක් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු රියදුරු බලපත්‍රය.

10. **අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

(*අ*) අයදුම්පත් **2026.06.30** දිනට හෝ එදිනට ප්‍රථම **"ලේකම්, දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය, 3 මහල, දක්ෂිණ පාය, ලබුදූව, ගාල්ල"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(*ආ*) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 06.1 දක්වාත් දෙවන පිටුව අංක 06.2 සිට 09 දක්වාත් II කොටසෙහි පළමු පිටුව අංක 01 සිට අංක 09 දක්වාත් දෙවන පිටුව අංක 10 වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(*ඇ*) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **"දකුණු පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයට (MN4-2025) අයත් ස්ථානභාර නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම "** යනුවෙන් සඳහන් කළ යුතු ය.

(ඉ) සියලුම නිලධාරින් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

11. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12. **පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය සතු වේ.**

**අයි. එස්. සමරකෝන්,**
ලේකම්.
දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය.

<u>ආදර්ශ අයදුම්පත්‍රය</u>

**දකුණු පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයට (MN4-2025) අයත් ස්ථානභාර නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම**

( කාර්යාලීය ප්‍රයෝජනය සඳහා )

1. 1.1 නිලධාරියාගේ සම්පූර්ණ නම :..............................................................
   1.2 මුලකුරු සමඟ නම :.............................................................. ( මයා / මිය / මෙනවිය )
   1.3 ස්ථිර ලිපිනය :..............................................................
   1.4 මුල් පත්වීම් දිනය :..............................................................
   1.5 සේවය ස්ථිර කළ දිනය :..............................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :- ..............................................................

   2.1 උපන් දිනය :

   වර්ෂය : .......................... මාසය : .......................... දිනය : ........................

   2.2 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

   අවුරුදු : ......................... මාස: ........................... දින: ........................

3. 3.1 වර්තමාන තනතුර :..............................................................
   3.2 සේවා ස්ථානය :..............................................................
   3.3 රාජකාරී ලිපිනය :..............................................................
   3.4 දුරකථන අංකය (කාර්යාලීය) :......................................... ජංගම :................................................

4. 4.1 ස්ත්‍රී / පුරුෂ භාවය ( පුරුෂ - M, ස්ත්‍රී – F ) :- ☐

   4.2 විවාහක / අවිවාහක බව :-..........................................

5. අධ්‍යාපන සුදුසුකම් : (සහතික කළ ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

| ආයතනය | කාලසීමාව | උපාධිය/ඩිප්ලෝමාව | පන්ති සාමාර්ථය තිබේනම් | වර්ෂය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

6. 6.1 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාග වර්ෂය හා මාසය : ...............................................................
II. විභාග අංකය : ................................................................................
III. සමත් වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

6.2 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

I. විභාග වර්ෂය හා මාසය : .............................................
II. විභාග අංකය : ...........................................................
III. සමත් වූ විෂයයන් :

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

7. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? ඔව් / නැත.

ඔව් නම් විස්තර සඳහන් කරන්න. ..................................................................................................................................
..................................................................................................................................
..................................................................................................................................
..................................................................................................................................

8. අයදුම්කරුගේ සහතිකය :-

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

...................................... ........................................
දිනය අයදුම්කරුගේ අත්සන

9. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................................................................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඔහු / ඇය ......................................... දින මා ඉදිරිපිට දී ඉහත 8 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි.

...............................................
සහතික කරන්නාගේ අත්සන

දිනය :- .........................................................................................
සහතික කරන්නාගේ නම :- .................................................................................
තනතුර :- ..........................................................................................................
ලිපිනය :- ..........................................................................................................
( නිල මුද්‍රාවෙන් සනාථ කරන්න. )

**II කොටස**

(දකුණු පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයට (MN4)2025 අයත් ස්ථානභාර නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ අයදුම් පත්‍ර යොමු කරනු ලබන ඉහත නම් සඳහන් නිලධාරියා / නිලධාරිනිය සම්බන්ධයෙන් පෞද්ගලික ලිපි ගොනුව භාර විෂය නිලධාරියා විසින් පහත කරුණු සම්පූර්ණ කළ යුතුය.)

1. සේවය ස්ථිර කර තිබේ ද? :.......................................................................

2. සේවය ස්ථිර කළ දිනය :..........................................................................

**3. 2026.06.30** දිනට සේවා කාලය :............................................................

4. ලබා ඇති ප්‍රශංසා හා දෝෂ දර්ශණ පිළිබඳ විස්තර : (තිබේනම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න. එහි සහතික කරන ලද පිටපත් අමුණා ඉදිරිපත් කරන්න)

5. පසුගිය වසර 05ක කාලය තුළ කාර්ය සාධනය :

| *වසර* | *කාර්ය සාධන මට්ටම* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

6. මුල් පත්වීමේ දින සිට 2026.06.30 දින දක්වා ලබා ඇති වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර :

| දින සිට | දින දක්වා | අවුරුදු | මාස | දින |
|---|---|---|---|---|
| ............... | ........................ | .................... | ..................... | ...................... |

7. සේවා කාලය තුළ විනය දඬුවමකට ලක්ව තිබේ ද? (විස්තර ලියන්න) :.....................................................................................

.......................................................................................................................................................................

8. මේ වනවිට ක්‍රියාත්මකවන හෝ ඉදිරියේ දී ක්‍රියාත්මක වීමට නියමිත මූලික විමර්ෂණ, විනය පරීක්ෂණ හෝ විගණන විමසුම් තිබේ ද? (ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න) :.......................................................................................................................

.......................................................................................................................................................................

9. ....................................................................................... මහතාගේ /මහත්මියගේ /මෙනවියගේ පෞද්ගලික ලිපිගොණුවේ පවතින ලේඛන අනුව ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මා විසින් පෞද්ගලිකවම සහතික වෙමි.

..........................................,
දිනය :............................ විෂය නිලධාරියාගේ අත්සන.

විෂය නිලධාරියාගේ නම :........................................................................................................
විෂය නිලධාරියාගේ තනතුර :.....................................................................................................

10. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය (රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

10.1 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොණුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ, වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය / අසතුටුදායකය.
සියලු වැටුප් වර්ධක උපයා ඇත / නැත.
කිසිඳු විනය දඬුවමකට ලක්වී නැත / ඇත.

10.2 ඉල්ලුම් කරනු ලබන තනතුරකට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය / නොහැකිය. ඉල්ලුම්පත්‍රය නිර්දේශ කරමි / නොකරමි.

...................................... ..........................................................................,
දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

05-439

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.